# කාර්යසාධන වාර්තාව

# 2023

# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල


| | |
|---|---|
| ලිපිනය | අංක 06, කොළඹ පාර,ගාල්ල |
| දුරකථන අංකය | 091-2222233, 091-2234235, 091-2227580 |
| ෆැක්ස් | 091-2222972, 091-2234236 |
| විද්‍යුත් තැපැල | disecgl@sltnet.lk |
| වෙබ් අඩවිය | www.galle.dist.gov.lk |

**කාර්යසාධන වාර්තාව - 2023**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල**


| පටුන | පිටු අංකය |
|---|---|
| **පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය** | **1-8** |
| 1.1 හැඳින්වීම | 1-5 |
| 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු | 6 |
| 1.3 ප්‍රධාන කාර්යයන් | 7 |
| 1.4 සංවිධාන සටහන | 7 |
| 1.5 ප්‍රධාන අංශයන් | 8 |
| **පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම** | 9 |
| **පරිච්ඡේදය 03 - 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්යසාධනය** | 10-35 |
| 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය | 10 |
| 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 11 |
| 3.3 මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය | 12 |
| 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් | 13-25 |
| 3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය | 26 |
| 3.6 වෙන්කරන ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය | 26 |
| 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන | 27-33 |
| 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය | 34 |
| 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව | 34 |
| **පරිච්ඡේදය 04- කාර්යසාධන දර්ශක** | **35** |
| 4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) | 35 |
| 4.1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව | 35 |
| 4.1.2 අනෙකුත් අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු වලට අදාළව | 36 |
| **පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය** | **37** |
| 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු | 37 |
| 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග | 37 |
| **පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ** | **38-43** |
| 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය | 38 |
| 6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම | 38 |
| 6.3 මානව සම්පත් සංවර්ධනය | 39-43 |
| **පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව** | **44-51** |

## පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැදින්වීම

ගාල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී වසම් 895 ක් පුරා විසිරී පැතිරී සිටින 1,146,421 ක් වූ ජනගහනය ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 ක් ඔස්සේ සම්බන්ධීකරණය කරමින් ග්‍රාමීය හා ප්‍රාදේශීය පරිපාලන කටයුතු මෙහෙයවනු ලබන්නේ ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟිනි.

මෙම ජනගහනයෙන් 29.4 % ක් කෘෂිකාර්මික අංශය ආශ්‍රිතවද 26.6 % ක් කර්මාන්ත අංශය ආශ්‍රිතවද 44 % ක් සේවා අංශය ආශ්‍රිතවද සේවා නියුක්ත වී ඇත. ඔවුන්ගේ මෙම කටයුතු වලදී සහ සාමාන්‍ය පොදුජන ජීවිතයේ දී මුහුණපාන විවිධ ආර්ථික සමාජීය හා සංස්කෘතික ගැටළු සහ ප්‍රශ්න වලට විසඳුම් ලබාදීමත්, ඔවුන්ගේ නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සපයාදීමත් මෙම කාර්යාලයේ ප්‍රධාන කාර්යභාරය වේ.

ඒ සඳහා ජනතාවට පහසුවෙන් ලඟාවිය හැකි පරිදි කොළඹ ගාල්ල ප්‍රධාන මාර්ගයේ ප්‍රධාන බස් නැවතුම් පොළට හා ප්‍රධාන දුම්රිය ස්ථානයට ඉතාම සමීපයේ සත්මහල් ගොඩනැගිල්ලක මෙම කාර්යාලය ස්ථාපනය වී ඇත. නූතන තාක්ෂණික උපකරණ භාවිත කරමින් නිලධාරින් 253 කින් යුත් කාර්ය මණ්ඩලයක් මඟින් මහජනතාවට සඵලදායී හා කාර්යක්ෂම සේවාවක් සැපයීමේ කාර්යයේ නිරතව සිටී. මීට අමතරව විවිධ රේඛීය අමාත්‍යාංශ හා පළාත් සභා කාර්යාල රාශියක් ද මෙම පරිශ්‍රය තුළ ස්ථානගතකර තිබීම නිසා මහජනතාවට වඩාත් හොඳ සේවාවක් ලබාදීමේ හැකියාව ලැබී ඇත.

1948 ආරම්භයේ සිට මේ දක්වා ආණ්ඩුවේ ඒජන්තවරුන් / දිසාපතිවරුන් / දිස්ත්‍රික් ලේකම්වරුන් 26 දෙනකු ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කටයුතු කර ඇත. ශාන්ත වීරසිංහ මහතා මෙහි වර්තමාන දිසාපතිවරයා වේ.



**පිහිටීම හා භූවිෂමතාව**

උතුරින් කළුතර දිස්ත්‍රික්කය හා රත්නපුර දිස්ත්‍රික්කයෙන් ද නැගෙනහිරින් මාතර දිස්ත්‍රික්කයෙන් ද උතුරින් සහ බටහිරින් ඉන්දියානු සාගරයෙන් ද මායිම්වන ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ සමස්ත වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර 1652කි. බෙන්තොට සිට ගොවියාපාන දක්වා වු කි.මී.73 ක් දිග පුළුල් වෙරළ තීරයක් ද මෙයට අයත් වේ.

ගාල්ල දිස්ත්‍රික්කයේ භූ විෂමතාවය ගත් විට බොහෝ ස්ථාන තැනිතලා ස්වරූපයක් ගන්නා අතර රට අභ්‍යන්තරයට වන්නට කඳු පිහිටා ඇත. හිනිදුම කන්ද, කබරගල කන්ද, කොන්දගල,තිබ්බොටුවාව, වාඩියහේන කන්ද, කැකිරිහේන, බලගල යනාදි කඳු ඒ අතර වේ. ගාල්ල දිස්ත්‍රික්කයේ භූමිය ප්‍රාග් කේම්බ්‍රිය යුගයට අයත් පාෂාණ වලින් නිර්මාණය වී තිබේ. රෙඩියෙලෝ පොඩිසොලික් පාෂාණය දිස්ත්‍රික්කය තුළ වැඩිම ව්‍යාප්තිය දක්නට ලැබේ. එමෙන්ම දුර්ලභ පාෂාණයක් වූ චන්ද්‍රකාන්ති පාෂාණය අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ මීටියාගොඩ ප්‍රදේශයේ දක්නට ඇත. වෙරළ ආසන්න කලාපයන්හි භූ ව්‍යුහයන් ලෙස කඩොලාන ශාක වලින් යුතු වගුරුබිම් කලපු හා කොරල්පර දක්නට ඇත. ස්වභාවධර්මයන්හි අපූර්ව නිර්මාණයක් වූ හික්කඩුව කොරල්පර අප රටේ පමණක් නොව විදේශයන්හි පවා ප්‍රසිද්ධියට පත්ව ඇත. එය සංචාරක පරාදීසයක් වන අතර රටේ සංවර්ධනයට සුවිශේෂී දායකත්වයක් සපයයි.

නිරිත දිග මෝසම් වැස්ස මගින් ප්‍රමාණවත් වර්ෂාවක් මෙම ප්‍රදේශයට ලැබෙන අතර මැයි සිට සැප්තැම්බර් දක්වා අධික වර්ෂාපතනයක් දක්නට ලැබේ. එයට අමතරව සංවහන වාසුළි ක්‍රියාකාරිත්වයෙන් ද වර්ෂාව ලැබේ. සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 226.15 ක් වන අතර සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය 85.30C° ක් පමණ වේ. ප්‍රදේශය හරහා ගලා බසිනා ප්‍රධාන ගංගාව සිංහරාජ අඩවියෙන් පටන්ගෙන ගිංතොට ප්‍රදේශයෙන් මුහුදට වැටෙන ගිංගඟ වේ.
එයට අමතරව බෙං ගඟ, මාදු ගඟ, කොග්ගල ඔය ප්‍රදේශයේ දක්නට ලැබෙන කුඩා ප්‍රමාණයේ ගංගාවන් වේ. කලාපයේ පවතින අධික උෂ්ණත්වය හා අධික වර්ෂාපතනය හේතු කොට ගෙන සශ්‍රික වනාන්තර නිර්මාණය වී ඇත. නිවර්තන තෙත් වනාන්තර ගණයට අයත් වන මෙන්ම ලෝක උරුමයක් ලෙස ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සිංහරාජ වනාන්තරයේ කොටසක් ද ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයට අයත් වේ.

එමෙන්ම ප්‍රදේශයේ ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථාන ලෙස රාම රාවණ යුගයට සාක්ෂි දරණ රුමස්සල කඳුවැටිය, ලංකාවේ යටත් විජිත යුගය සංකේතවත් කරමින් මුළු ප්‍රදේශය පුරා තේජස පතුරවමින් විජයමාන වන ගාල්ල කොටුව සහ කොටු පවුර, දෙවොල් දෙවියන්ගේ වාසභූමිය ලෙස සැලකෙන සීනිගම හා වැල්ලේ දේවාල පුදබිම හා බෞද්ධ සිද්ධස්ථාන වශයෙන් වැදගත් වන යටගල හා පරගොඩ පූජා භූමි ගාල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇත.

ශ්‍රී ලාංකාවේ ජාතික ආදායමට ගාල්ල දිස්ත්‍රික්කයෙන් සැලකිය යුතු දායකත්වයක් ලබා දේ. කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ වී, තේ, රබර්, පොල්, කුරුඳු වැනි බෝග ප්‍රධාන තැනක් ගනී. එමෙන්ම බෙන්තොට, හික්කඩුව, කොග්ගල, උණවටුන වැනි වෙරළ ආසන්න ප්‍රදේශ සංචාරක ව්‍යාපාරය සඳහා ද, රූකඩ හා වෙස්මුහුණු කැටයම් සඳහා අම්බලන්ගොඩ නගරය ද ප්‍රසිද්ධියක් උසුලයි. ගාලු නගරයට කි.මී. 10 ක් පමණ දුරකින් කොග්ගල නිදහස් වෙළඳ කලාපය පිහිටා ඇති අතර ඉන් ප්‍රදේශයේ තරුණ තරුණියන් විශාල පිරිසකට රැකියා පහසුකම් සැලසී ඇත.

ගාල්ල දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් මූලික දර්ශක කිහිපයක් පහත සඳහන් වේ.

| | |
|---|---|
| සාක්ෂරතාවය (2022) | 93.9% |
| පුරුෂ | 93.9% |
| ස්ත්‍රී | 93.8% |
| දරිද්‍රතා දර්ශකය (2019) | 3.0% |
| පරිගණක සාක්ෂරතාව (2020) | 27.9% |
| අන්තර් ජාලය භාවිතය (වයස අවු. 5-69) (2021) | 44.8% |
| ඊ මේල් භාවිතය (වයස අවු. 5-69) (2021) | 16.7% |

මූලාශ්‍රය - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**ජීවනෝපාය මාර්ග**

| විස්තරය | 2020 | 2021 | 2022 |
|---|---|---|---|
| ශ්‍රම බල සහභාගීත්ව අනුපාතය | | | |
| මුළු සංඛ්‍යාව | 48.9 | 49.0 | 50.5 |
| පිරිමි | 68.3 | 69.1 | 67.6 |
| ගැහැණු | 32.4 | 32.0 | 35.7 |
| සේවා නියුක්ත අනුපාතය | | | |
| රැකියා නියුක්ත | 93.0 | 93.0 | 94.3 |
| රැකියා වියුක්ත | 7.0 | 7.0 | 5.7 |
| සේවා වියුක්ත අනුපාතය | | | |
| පිරිමි | 5.4 | 5.0 | 4.6 |
| ගැහැණු | 9.9 | 10.8 | 7.4 |

**සේවා නියුක්තිය - 2023**

| අංශය | ප්‍රතිශතය % |
|---|---|
| **කෘෂිකාර්මික** | 29.4 |
| **කාර්මික** | 26.6 |
| **සේවා** | 44.0 |




**ඉඩම් පරිහරණ රටාව (2023)**

| **විස්තරය** | **ප්‍රමාණය (ව.කි.මී.)** | **ප්‍රතිශතය%** |
|---|---|---|
| ගොඩබිම් ප්‍රමාණය | 1,628.60 | 98.58 |
| අභ්‍යන්තර ජලාශ | 23.40 | 1.42 |
| මුළු බිම් ප්‍රමාණය | 1,652.00 | 100.00 |
| වගා කළ මුළු බිම් ප්‍රමාණය | 1,271.62 | 78.08 |
| වගා නොකළ මුළු බිම් ප්‍රමාණය | 64.95 | 3.99 |
| වනාන්තර මුළු බිම් ප්‍රමාණය | 292.03 | 17.93 |
| මුළු බිම් ප්‍රමාණය | 1,628.60 | 100.00 |

මූලාශ්‍රය:- ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව හා දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය

**ගොඩ ගොවිතැන 2023**

| **බෝගය** | **බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)** | **බෝගය** | **බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)** | **බෝගය** | **බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)** | **බෝගය** | **බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)** |
|---|---|---|---|---|---|---|---|
| තේ | 35,600.18 | කෝපි | 33.67 | බුලත් | 157.68 | දෙහි | 210.57 |
| රබර් | 6,458.71 | ගම්මිරිස් | 1,266.74 | පුවක් | 735.25 | කොස් | 1256.53 |
| පොල් | 2,941.23 | කජු | 17.16 | අඹ | 912.55 | කෙසෙල් | 1528.44 |
| කුරුඳු | 14,112.45 | කරාබු | 10.37 | දොඩම් | 225.06 | පැපොල් | 368.34 |

මූලාශ්‍රය :- ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ලංකාවේ ජාතික ආදායමට සැලකිය යුතු දායකත්වයක් ඉහත ක්ෂේත්‍රයන් ඔස්සේ ලබාදෙන අතර කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ තේ, රබර්, පොල් හා කුරුඳු වැනි භෝග ප්‍රධාන තැනක් ගනී.

දිස්ත්‍රික්කයේ පාරම්පරික කර්මාන්ත අතර පන් පැදුරු, බීරළු රේන්ද, ලී කැටයම්, වෙස් මුහුණු හා රුකඩ ප්‍රධාන තැනක් ගනී.

මාතර කොළඹ අධිවේගී මාර්ගය රටේ සමස්ත ජාතික ආර්ථික සංවර්ධනයට ගාල්ල දිස්ත්‍රික්කයේ දායකත්වය තවත් වැඩි කිරීමට හේතු වී ඇත. එමෙන්ම සංචාරක ව්‍යාපාරයට මෙන්ම ගාල්ල වරාය කටයුතු වලට ද මෙය විශාල ශක්තියක් වී ඇත.

**ජන සංඛ්‍යා දත්ත**

2023 වර්ෂයේ ගාල්ල දිස්ත්‍රික්කයේ ජනගහනය 1,146,421ක් වන අතර වර්ෂය සඳහා පුරුෂ ජනගහනය 549,745 ක් ද ස්ත්‍රී ජනගහනය 596,676 ක් ද වේ.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පුරුෂ | ස්ත්‍රී | එකතුව | වර්ග ප්‍රමාණය (ව.කි.මී.) | ජන ඝනත්වය (ව.කි.මී. 1 ට) |
|---|---|---|---|---|---|
| බෙන්තොට | 25,966 | 27,914 | 53,880 | 74 | 728 |
| බලපිටිය | 34,476 | 38,225 | 72,701 | 55 | 1322 |
| කරන්දෙණිය | 32,533 | 34,849 | 67,381 | 88 | 766 |
| ඇල්පිටිය | 33,496 | 36,288 | 69,784 | 150 | 465 |
| නියාගම | 18,629 | 19,725 | 38,354 | 109 | 352 |
| තවලම | 17,204 | 17,953 | 35,157 | 178 | 198 |
| නෙළුව | 15,519 | 15,359 | 30,878 | 155 | 199 |
| නාගොඩ | 27,963 | 30,073 | 58,035 | 179 | 324 |
| බද්දේගම | 24,750 | 27,062 | 51,812 | 66 | 785 |
| වදුරඹ | 13,801 | 15,256 | 29,057 | 45 | 646 |
| වැලිවිටිය-දිවිතුර | 15,081 | 16,559 | 31,640 | 60 | 527 |
| අම්බලන්ගොඩ | 29,435 | 31,977 | 61,412 | 52 | 1181 |
| ගෝනාපිනුවල | 11,063 | 12,392 | 23,455 | 27 | 869 |
| මාදම්පාගම | 17,718 | 18,868 | 36,587 | 24 | 1524 |
| හික්කඩුව | 13,930 | 15,261 | 29,191 | 13 | 2245 |
| රත්ගම | 21,293 | 22,802 | 44,095 | 28 | 1575 |
| කඩවත්සතර | 52,609 | 57,091 | 109,699 | 24 | 4571 |
| බෝපේ-පෝද්දල | 25,728 | 28,536 | 54,264 | 30 | 1809 |
| අක්මීමන | 39,790 | 44,064 | 83,853 | 65 | 1290 |
| යක්කලමුල්ල | 23,906 | 25,631 | 49,536 | 110 | 450 |
| ඉමදූව | 22,952 | 25,434 | 48,387 | 67 | 722 |
| හබරාදූව | 31,905 | 35,359 | 67,264 | 53 | 1269 |
| **එකතුව** | **549,745** | **596,676** | **1,146,421** | **1,652** | **694** |

මූලාශ්‍රය :- ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**උෂ්ණත්වය හා වර්ෂාපතන රටාව**

| මාසය | වර්ෂාප තනය (මිමී) | උෂ්ණත්වය (C⁰) | |
|---|---|---|---|
| | | වාර්ෂික උෂ්ණත්වය උපරිම | වාර්ෂික උෂ්ණත්වය අවම |
| ජනවාරි | 91.1 | 29.0 | 23.5 |
| පෙබරවාරි | 277.6 | 29.9 | 24.0 |
| මාර්තු | 230.3 | 31.1 | 24.8 |
| අප්‍රේල් | 134.2 | 31.3 | 25.5 |
| මැයි | 320.6 | 30.3 | 26.6 |
| ජුනි | 240.6 | 29.8 | 26.5 |
| ජුලි | 129.4 | 29.1 | 26.1 |
| අගෝස්තු | 187.0 | 29.8 | 26.9 |
| සැප්තැම්බර් | 695.2 | 29.0 | 24.8 |
| ඔක්තෝම්බර් | 833.7 | 29.2 | 24.6 |
| නොවැම්බර් | 394.3 | 30.3 | 25.0 |
| දෙසැම්බර් | 408.2 | 30.4 | 25 |

මූලාශ්‍රය: කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව 2023







## දිස්ත්‍රික්කයේ මූලික සංඛ්‍යාලේඛන තොරතුරු 2023

| පළාත | දකුණු පළාත |
|---|---|
| මුළු භූමි ප්‍රමාණය | 1,652 km² |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව | 22 |
| ග්‍රාම නිලධාරී කොට්ඨාස සංඛ්‍යාව | 895 |
| ගම්මාන සංඛ්‍යාව | 2,423 |
| මුළු ඡන්දදායකයින් සංඛ්‍යාව * | 884,028 |
| ඡන්ද කොට්ඨාස සංඛ්‍යාව කේවල * | 270 |
| බහු | 02 |
| මහ නගර සභා සංඛ්‍යාව * | 01 |
| නගර සභා සංඛ්‍යාව * | 02 |
| ප්‍රාදේශීය සභා සංඛ්‍යාව * | 17 |
| කලාප අධ්‍යාපන කාර්යාල සංඛ්‍යාව | 04 |
| පාසල් සංඛ්‍යාව * | 427 |
| ගුරුවරු සංඛ්‍යාව * | 11,409 |
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සංඛ්‍යාව | 10 |
| 2023 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ජන සංඛ්‍යාව | 1,139,000 |

*2022 වසරේ තොරතුරු

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

- සෞභාග්‍යමත් දිස්ත්‍රික්කයක්
- සෞභාග්‍යමත් ගාල්ලක්

**මෙහෙවර**

- දූෂණයෙන් තොර, කාර්යක්ෂම හා සඵලදායි පාලනයක් තුලින් ජීවනෝපාය සහ යටිතල පහසුකම් සංවර්ධනය, මානව සම්පත් සංවර්ධනය සහ මූල්‍ය කළමනාකරණය, පාරිසරික සංරක්ෂණය, ඉඩම් සහ ආපදා කළමනාකරණය, සමාජ සුභ සාධනය සහසමාජ සංවර්ධනය

**අරමුණු**

- ✓ මධ්‍යම රජයේ දිස්ත්‍රික් නියෝජිත ආයතනය වශයෙන් කටයුතු කරමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ග්‍රාම නිලධාරි වසම් මට්ටම දක්වා රජයේ පරිපාලන යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම.

- ✓ මධ්‍යම රජයේ හා පළාත් සභාව නියෝජනය කරන ආයතන සංස්ථාපිත මණ්ඩල හා රාජ්‍ය නොවන සංවිධාන වලින් දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරනු ලබන විවිධ සංවර්ධන වැඩසටහන් වල ඒකාබද්ධ සංවර්ධන සැලසුම් සකස් කිරීමේ සම්බන්ධීකරණ හා පසුවිපරම් කිරීමේ ප්‍රධාන සම්බන්ධීකාරක ආයතනය ලෙස කටයුතු කරමින් දිස්ත්‍රික්කයේ ජනතාවගේ ආර්ථිකමය ජීවනෝපාය හා යටිතල පහසුකම් සංවර්ධන ප්‍රතිලාභයන් තිරසාර ලෙස ලබා දීම.

- ✓ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වලින් දිස්ත්‍රික්කයේ ජනතාවට ලබා දෙන ආර්ථික, සමාජීය හා සංස්කෘතික ප්‍රතිලාභ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ග්‍රාමීය මට්ටමට කඩිනමින් සම්ප්‍රේෂණය කර සේවාවන් ලබා දීම සඳහා වැඩ සැලසුම් සකස් කිරීම.

- ✓ දිස්ත්‍රික්කයේ ස්ථිරසාර සංවර්ධන ප්‍රවාහයක් බිහිකිරීම සඳහා ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමෙන් ආර්ථික සමාජීය හා සංස්කෘතික දත්ත එක් රැස් කරමින් තොරතුරු පද්ධතියක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.

- ✓ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඔස්සේ මහජනතාවට සේවා සැපයීම වෙනුවෙන් විවිධ රාජ්‍ය ආයතන, දෙපාර්තමේන්තු හා සංස්ථා වෙනුවෙන් ආදායම් එක් රැස් කිරීම, ගිණුම් ගත කිරීම හා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම.

- ✓ ගංවතුර, සුළි සුළං, නියඟ, මුහුද ගොඩගැලීම වැනි විස්තීර්ණ ස්වභාවික ආපදා අවස්ථා වල දී ජනතාවගේ ජීවන තත්ත්වය යථා තත්ත්වයට පත් කිරීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

- ✓ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 හි ග්‍රාම නිලධාරී කාර්යාල 895 හි පරිපාලන කටයුතු නියාමනය කිරීම හා අධීක්ෂණය කිරීම.
- ✓ මධ්‍යම රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල දිස්ත්‍රික් නියෝජිත ආයතනය වශයෙන් ක්‍රියා කරමින් එම ආයතනවල අරමුණු, පරමාර්ථ හා කාර්යයන් ඉටු වන පරිදි සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- ✓ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව පැවැත්වීම හා දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සැලසුම් කිරීම, සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.
- ✓ විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සපයන සේවාවලදී ආදායම් ගණන් දීමේ නිලධාරීන් වෙනුවෙන් ඔවුන්ගේ ආදායම් එක් රැස් කිරීම, ගිණුම්ගත කිරීම, භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම හා අදාළ ආදායම් ගණන් දීමේ නිලධාරීන් දැනුවත් කිරීම.
- ✓ ජාතික මට්ටමේ හා දිස්ත්‍රික් මට්ටමේ සංස්කෘතික, ආගමික හා වෙනත් කාලීන රාජ්‍ය උත්සව සංවිධානය කිරීමේ දිස්ත්‍රික් නියෝජිත ආයතනය ලෙස ක්‍රියා කිරීම.
- ✓ සියළුම මැතිවරණ කටයුතු වල දී මැතිවරණ කොමිෂන් සභාවේ නියෝජිත ආයතනය වශයෙන් ක්‍රියා කිරීම.
- ✓ දිස්ත්‍රික්කය තුළ ඉඩම් ඔප්පු ලියාපදිංචි කිරීමත්, උප්පැන්න, මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ හා අදාළ ලේඛනවල පිටපත් නිකුත් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ✓ නියඟ, ගංවතුර, සුළි සුළං, මුහුද ගොඩ ගැලීම් වැනි විස්තීර්ණ ස්වාභාවික ආපදා අවස්ථාවන්හි දී රජයේ නියෝජිතයා ලෙස ක්‍රියා කරමින් ආපදා කළමනාකරණ කටයුතු සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා පසු විපරම් කටයුතු කිරීම තුළින් ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම හා ස්ථාවර කිරීම.
- ✓ රජයේ විශ්‍රාම වැටුප් ගෙවීම හා සම්බන්ධීකරණය කිරීම.
- ✓ මහජන දුක්ගැනවිලි සඳහා ඵලදායී ප්‍රතිචාරාත්මක ආයතනයක් ලෙස කටයුතු කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
- ✓ ඉඩම් අහිමි පුරවැසියන්ට ඉඩම් කොටසක හිමිකම තහවුරු කිරීම, රජයේ ඉඩම් සංවර්ධනය කිරීම හා ඊට අදාළ කාර්යයන් සම්බන්ධීකරණය කිරීම

## 1.4 සංවිධාන සටහන



## 1.5 ප්‍රධාන අංශයන්

- ආයතන අංශය
- සේවා අංශය
- ඉඩම් හා සංවර්ධන අංශය
- ගිණුම් අංශය
- සැලසුම් අංශය
- ඉංජිනේරු අංශය
- අභ්‍යන්තර විගණන අංශය

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

1. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ගාල්ල කඩවත් සතර
2. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - තවලම
3. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - නියාගම
4. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - අම්බලන්ගොඩ
5. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කරන්දෙණිය
6. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ඇල්පිටිය
7. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - නෙළුව
8. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - නාගොඩ
9. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බලපිටිය
10. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හික්කඩුව
11. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - අක්මීමණ
12. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බෙන්තොට
13. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හබරාදුව
14. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බද්දේගම
15. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - යක්කලමුල්ල
16. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බෝපෙ පෝද්දල
17. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - වැලිවිටිය දිවිතුර
18. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ඉමදූව
19. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ගෝනපීනුවල
20. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - රත්ගම
21. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මාදම්පාගම
22. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - වදුරඹ

## පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ගාල්ල දිස්ත්‍රික්කය දකුණු පළාතේ වැඩිම ජනගහනයක් සහිත දිස්ත්‍රික්කය වේ. ශ්‍රී ලංකාවේ මුළු ජනගහණයෙන් 5.17% ක් එනම් 1,146,421 ක ප්‍රමාණයක් ග්‍රාම නිලධාරී වසම් 895 ක් පුරා විසිරී ජීවත් වේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 ක් ඔස්සේ සම්බන්ධීකරණය කරමින් ග්‍රාමීය හා ප්‍රාදේශීය පරිපාලන කටයුතු මෙහෙයවනු ලබන්නේ ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟිනි. පරිපාලන කටයුතු මෙහෙයවීම සඳහා 2023 වර්ෂයෙහි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 හි නිලධාරීන් 3,819 දෙනෙකු සේවය කර ඇත.

ගාල්ල දිස්ත්‍රික්කයේ මහජනතාවගේ ආර්ථික සමාජීය හා අනෙකුත් යටිතල පහසුකම් අවශ්‍යතා සපුරාලීම හා ජීවන තත්ත්වය නංවාලීම අරමුණු කර ගනිමින් 2023 වර්ෂය තුළදී ගාල්ල දිස්ත්‍රික්කය සඳහා 261 වැය ශීර්ෂය යටතේ අයවැය ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන ලෙස රු.මි.2,158 ක සමස්ත ප්‍රතිපාදනයක් අප කාර්යාලය සඳහා වෙන් කර තිබුණි. මෙම ප්‍රතිපාදන වලින් වර්ෂය තුළදී රු.මි. 2,019 ක් උපයෝජනය කර තිබුණි. පුනරාවර්තන වියදම් උපයෝජන ප්‍රතිශතය 95% ක් වූ අතර ප්‍රාග්ධන වියදම් උපයෝජන ප්‍රතිශතය 51% ක් විය. එමෙන්ම අනෙකුත් රේඛීය අමාත්‍යාංශයන් හා දෙපාර්තමේන්තු 45 කින් ලැබුණු ප්‍රතිපාදන රු. රු.මි. 3,031 ක මුදල, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සියළුම නිලධාරීන් හා අත්‍යවශ්‍ය තාක්ෂණිකමය සහය සේවා සපයන ආයතන මඟින් ලද සහය මගින් මෙම ප්‍රතිපාදන උපයෝජනය 100% දක්වා වූ මට්ටමකට වැඩිකර ගැනීමට හැකිවීම අතිශය ප්‍රසංශනීය වේ.

ගෝලීයව මෙන්ම දේශීයව පවතින සමාජ ආර්ථික අභියෝග හමුවේ දැඩි ආර්ථික දුෂ්කරතාවයන්ට මුහුණ දී ඇති ජනතාවට සහන සැලසීමට ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කරනු ලබන සෙනහස සමාජ සත්කාරක වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර එමඟින් 2023 වර්ෂය තුලදී රු.මි.155ක් අඩු ආදායම් ලාභී පවුල් සඳහා වියලි ආහාර ලබාදීම, පාසැල් උපකරණ ලබාදීම, ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ආදිය රාජ්‍ය නොවන සංවිධානයන්හි සහයෝගයෙන් සිදුකරන ලදී.

එසේම ගාලු දිසා ප්‍රවර්ධා වැඩසටහන ආරම්භ කිරීම මඟින් දිස්ත්‍රික්කයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නගා සිටුවීමට කටයුතු කිරීම සහ ඊට සමගාමීව ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් ව්‍යාවසායක සභා පිහිටුවීමට කටයුතු කරීම, ව්‍යවසායකයින්ගේ වෙළඳපොළ නගා සිටුවීම අරමුණු කරගෙන ගාලු නගරයේ ‘Galle Street Fair’ වෙළඳ ප්‍රදර්ශනය ආරම්භ කිරීම සහ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගයීම සඳහා ගාලු දිසා ප්‍රවර්ධා වාර්ෂික සම්මාන ප්‍රදානෝත්සවය වාර්ෂිකව පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම යනාදි කටයුතු ද සිදු කරන ලදී.

තවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා 2023 වසර තුළදි රු.මි.1.3 ක් වියදම් කර ඇත. පැය අටෙහි රාජකාරි වලින් ඔබ්බට ගොස් නිලධාරීන්ගේ කායික මානසික තෘප්තිය ඉහළ නැංවීමේ අරමුණ ඇතිව වාර්ෂික පිරිත් පිංකම, වාර්ෂික විනෝද චාරිකාව, ශරීර සුවතා වැඩසටහන්, රුක්රෝපණ වැඩසටහන්,කච්චේරි නයිට් විවිධ ප්‍රසංගය යනාදි වැඩසටහන් සංවිධානය කරන ලදි.

ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණය සහතික කිරීම, ජීවනෝපාය සංවර්ධනය සඳහා ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන කේන්ද්‍ර සවිබල ගැන්වීමේ බහු ආංශික ඒකාබද්ධ යාන්ත්‍රණය 2024 වර්ෂයේදීද අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.ගාල්ල දිස්ත්‍රික්කයේ තිරසර නිෂ්පාදන ආර්ථික සංවර්ධනය සඳහා වැවිලි හා කෘෂිකර්ම, සංචාරක කර්මාන්ත හා සේවා, ධීවර හා සත්ත්ව නිෂ්පාදන, මූල්‍ය කලමණාකරණ යන ක්ෂේත්‍ර යටතේ බහු ආංශික ඒකාබද්ධ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව ආයතනයේ අරමුණු මෙන්ම සමස්ත රජයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට මෙම වර්ෂය තුළදි මෙන්ම ඉදිරි වසර වලදීද සමස්ථ කාර්ය මණ්ඩලය මෙහෙයවමින්, පවත්නා තත්ත්වයන්ට අනුගත වෙමින්, පවත්නා සම්පත් උපරිම උපයෝජනය කරමින් සෞභාග්‍යමත් ගාල්ල ගොඩනැගීම සඳහා කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමි.

ශාන්ත වීරසිංහ,
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කය.

පරිච්ඡේදය 03 – 2023.12.31 දිනෙන් අවසන් වසර සඳහා වන මූල්‍ය කාර්යය සාධනය.

3.1 මූල්‍ය කාර්යය සාධනය

ඒසීඒ -එෆ්

## 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු. | | සටහන | තත්‍ය 2023 රු. | තත්‍ය 2022 රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 4,823,542,285 | 5,445,304,000 | ඒසීඒ-3 |
| | නොපිය වූ අග්‍රිම ශේෂය | | 115,536 | 194,086 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 297,121,955 | 328,796,590 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 98,628,763 | 80,819,289 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **5,219,408,539** | 5,855,113,965 | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **5,219,408,539** | 5,855,113,965 | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 115,536 | 82,125,050 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | 5,219,293,003 | 5,772,988,915 | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | ඒසීඒ-2(ii) |
| 1,746,000,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 1,709,338,274 | 1,339,150,520 | ඒසීඒ-2(ii) |
| 285,560,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 233,931,216 | 189,286,514 | ඒසීඒ-2(ii) |
| 33,686,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 28,176,653 | 15,970,438 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | 2,945,340 | ඒසීඒ-2(ii) |
| 2,065,246,000 | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **1,971,446,143** | 1,547,352,812 | |
| | **මූලධන වියදම්** | | | | |
| 54,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 30,122,903 | 19,385,029 | ඒසීඒ-2(ii) |
| 16,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 3,814,792 | 28,874,443 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 6,000,000 | හැකියා වර්ධනය | 14 | 1,304,008 | 2,096,426 | ඒසීඒ-2(ii) |
| 16,900,000 | වෙනත් මූලධන වියදම් | 15 | 11,969,611 | 678,494,220 | ඒසීඒ-2(ii) |
| 92,900,000 | **මුළු මූලධන වියදම් (උ)** | | **47,211,314** | 728,850,118 | |
| | තැන්පතු ගෙවීම් | | 354,810,515 | 496,583,442 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 99,559,064 | 90,194,453 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | 454,369,579 | 586,777,895 | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 2,473,027,036 | 2,862,980,825 | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | 2,746,265,967 | 2,910,008,090 | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | 2,746,265,967 | 2,909,892,554 | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | 115,536 | ඒසීඒ-3 |
| | | | 2,746,265,967 | 2,910,008,090 | |

## 3.1 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

**2023 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | කතාව 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **<u>මූල්‍ය නොවන වත්කම්</u>** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 4,563,387,212 | 4,381,167,219 |
| **<u>මූල්‍ය වත්කම්</u>** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 588,262,151 | 587,331,850 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | 115,536 |
| මුළු වත්කම් | | **5,151,649,363** | **4,968,614,605** |
| **<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (109,605,849) | (168,224,709) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 4,563,387,212 | 4,381,167,219 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | 335,089,281 | 335,089,281 |
| **<u>ජංගම වගකීම්</u>** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 362,778,719 | 420,467,278 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | 115,536 |
| මුළු වගකීම් | | **5,151,649,363** | **4,968,614,605** |

පිටු අංක..01....සිට ..29... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ..30.... සිට ..45.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන ගණකාධිකාරි |
| ප්‍රදීප් යසරත්න | ශාන්ත වීරසිංහ | ඩී.එස්. රණසිංහ |
| ලේකම්,රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | දිස්ත්‍රික් ලේකම්/දිසාපති ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය- ගාල්ල |
| දිනය: 2024/02/15 | දිනය: 15/02/2024 | දිනය : 2024.02.15 |

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
(ස්වදේශ කටයුතු අංශය)
''නිල මැදුර'' ඇල්විටිගල මාවත, කොළඹ 05.

ශාන්ත වීරසිංහ
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කය

ඩී.එස්. රණසිංහ
ප්‍රධාන ගණකාධිකාරි
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
ගාල්ල.

## 3.3 මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ - සී

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | සතය 2023 රු. | 2022 රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 281,982,985 | 339,755,995 |
| අග්‍රිම ලැබීම් | 4,823,542,285 | 5,445,304,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 150,545,666 | 122,801,800 |
| තැන්පතු ලැබීම් | 297,121,955 | 328,796,590 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **5,553,192,891** | **6,236,658,385** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 3,236,462,465 | 3,277,391,929 |
| සහනාධාර සහ මාරුකිරීම් | 1,507,005,341 | 1,104,277,362 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | - | 2,945,340 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 115,536 | 82,125,050 |
| අත්තිකාරම් ගෙවීම් | 162,835,342 | 123,255,637 |
| තැන්පතු ගෙවීම් | 354,810,515 | 496,583,442 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **5,261,229,199** | **5,086,578,760** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)** | **291,963,692** | **1,150,079,625** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | 397,620 | 349,765 |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | **397,620** | **349,765** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| මූලධන වියදම් | 292,476,848 | 1,150,507,940 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **292,476,848** | **1,150,507,940** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)** | (292,079,228) | (1,150,158,175) |
| **ඇ) + (ඊ)** | (115,536) | (78,550) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)** | (115,536) | (78,550) |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | 115,536 | 194,086 |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | 115,536 |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

ඒසීඒ-2(ii)

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය :261 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගාල්ල

රු.

| වැය විෂයය | සටහන | මූල්‍යකරණ සංකේත අංකය | ප්‍රතිපාදනය: වාර්ෂික අයවැය ගත ප්‍රතිපාදන (1) | ප්‍රතිපාදනය: පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | ප්‍රතිපාදනය: මු.රෙ. 66/69 මාරු කිරීම් (3) (-)/+ | ප්‍රතිපාදනය: මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | වියදම: මුදල් පොතට අනුව වියදම (5) | වියදම: මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව) (6) | වියදම: මුළු වියදම (7)= (5)+(6) | ශුද්ධ බලපෑම: ඉතිරිය /ඉක්මවීම් (8)=(4)-(7) | ශුද්ධ බලපෑම: ඉතිරිය(ඉක්මවීම) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස (9)=(8)/(4)*100 | වෙනස්කම්වලට හේතු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | | | | | | | | | | | |
| වැඩසටහන (1) | | | | | | | | | | | | |
| වැඩසට./ව්‍යාපෘ./උප ව්‍යාපෘ./වැය විෂයය අංකය | | | | | | | | | | | | |
| **වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ** | 5 | | | | | | | | | | | |
| **පුද්ගල පඩිනඩි** | | | | | | | | | | | | |
| 1001 වැටුප් හා වේතන | | 11 | 1,167,000,000 | | | 1,167,000,000 | 1,144,250,640 | | 1,144,250,640 | 22,749,360 | 2 | අනියම් ඉතිරිවීම |
| 1002 අතිකාල හා නිවාඩු දින වැටුප් | | 11 | 28,000,000 | | | 28,000,000 | 19,271,816 | | 19,271,816 | 8,728,184 | 31 | ජාතික අයවැය චක්‍රලේඛ 01/2023 අනුව ඉතිරි කිරීම හා රාජ්‍ය වියදම් පාලනය කිරීම. |
| 1003 වෙනත් දීමනා | | 11 | 551,000,000 | | | 551,000,000 | 532,191,973 | 1,540,780<br>12,083,065 | 545,815,818 | 5,184,182 | 1 | අනියම් ඉතිරිවීම |
| **වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද අනෙකුත් භාණ්ඩ හා සේවා** | 6 | | | | | | | | | | | |
| **ගමන් වියදම්** | | | | | | | | | | | | |
| 1101 දේශීය | | 11 | 33,200,000 | | | 33,200,000 | 26,501,236 | | 26,501,236 | 6,698,764 | 20 | ජාතික අයවැය චක්‍රලේඛ 01/2023 අනුව ඉතිරි කිරීම හා රාජ්‍ය වියදම් පාලනය කිරීම. |
| **එකතුව (අ)** | | | **33,200,000** | - | - | **33,200,000** | **26,501,236** | - | **26,501,236** | **6,698,764** | | |
| **සැපයීම්** | | | | | | | | | | | | |
| 1201 ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | | 11 | 34,500,000 | | | 34,500,000 | 28,532,128 | | 28,532,128 | 5,967,872 | 17 | ජාතික අයවැය චක්‍රලේඛ 01/2023 අනුව ඉතිරි කිරීම හා රාජ්‍ය වියදම් පාලනය කිරීම. |
| 1202 ඉන්ධන | | 11 | 41,000,000 | | (1,600,000) | 39,400,000 | 32,560,233 | | 32,560,233 | 6,839,767 | 17 | ජාතික අයවැය චක්‍රලේඛ 01/2023 අනුව ඉතිරි කිරීම හා රාජ්‍ය වියදම් පාලනය කිරීම. |
| 1203 ආහාර පාන හා නිල ඇඳුම් | | 11 | 550,000 | | | 550,000 | 542,900 | | 542,900 | 7,100 | 1 | අනියම් ඉතිරිවීම |
| **එකතුව (ආ)** | | | **76,050,000** | - | **(1,600,000)** | **74,450,000** | **61,635,261** | - | **61,635,261** | **12,814,739** | | |

ඒසීඒ-2(ii)

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය :261

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගාල්ල

රු.

| වැය විෂයය | සටහන | මූලාශ්‍ර සංකේත අංකය | ප්‍රතිපාදනය: වාර්ෂික අයවැය ගත ප්‍රතිපාදන (1) | ප්‍රතිපාදනය: පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | ප්‍රතිපාදනය: මු.රෙ. 66/69 මාරු කිරීම් (3) (-)/+ | ප්‍රතිපාදනය: මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | වියදම: මුදල් පොතට අනුව වියදම (5) | වියදම: මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව) (6) | වියදම: මුළු වියදම (7)= (5)+(6) | ශුද්ධ බලපෑම: ඉතිරිය /ඉක්මවීම් (8)=(4)-(7) | ශුද්ධ බලපෑම: ඉතිරිය(ඉක්මවීම්) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස (9)=(8)/(4)*100 | වෙනස්කම්වලට හේතු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| <u>නඩත්තු වියදම්</u> | | | | | | | | | | | | |
| 1301 වාහන | | 11 | 30,300,000 | | (6,150,000) | 24,150,000 | 17,671,349 | | 17,671,349 | 6,478,651 | 27 | ජාතික අයවැය චක්‍රලේඛ 01/2023 අනුව ඉතිරි කිරීම හා රාජ්‍ය වියදම් පාලනය කිරීම. |
| 1302 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | | 11 | 6,000,000 | | 2,950,000 | 8,950,000 | 8,785,731 | | 8,785,731 | 164,269 | 2 | අනියම් ඉතිරිවීම |
| 1303 ගොඩනැගිලි සහ ඉදිකිරීම් | | 11 | 7,900,000 | | | 7,900,000 | 3,769,517 | | 3,769,517 | 4,130,483 | 52 | ජාතික අයවැය චක්‍රලේඛ 01/2023 අනුව ඉතිරි කිරීම හා රාජ්‍ය වියදම් පාලනය කිරීම. |
| **එකතුව ( ඇ )** | | | **44,200,000** | **-** | **(3,200,000)** | **41,000,000** | **30,226,597** | **-** | **30,226,597** | **10,773,403** | | |
| <u>සේවා</u> | | | | | | | | | | | | |
| 1401 ප්‍රවාහන | | 11 | 1,200,000 | | | 1,200,000 | 1,200,000 | | 1,200,000 | - | - | |
| 1402 තැපැල් සහ සන්නිවේදන | | 11 | 21,500,000 | | | 21,500,000 | 18,426,009 | | 18,426,009 | 3,073,991 | 14 | ජාතික අයවැය චක්‍රලේඛ 01/2023 අනුව ඉතිරි කිරීම හා දෙසැම්බර් මස බිල්පත් ඉදිරිපත් නොවීම. |
| 1403 විදුලිය සහ ජලය | | 11 | 24,500,000 | | 4,160,000 | 28,660,000 | 25,508,438 | | 25,508,438 | 3,151,562 | 11 | ජාතික අයවැය චක්‍රලේඛ 01/2023 අනුව ඉතිරි කිරීම හා දෙසැම්බර් මස බිල්පත් ඉදිරිපත් නොවීම. |
| 1404 බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | | 11 | 4,350,000 | | | 4,350,000 | 3,266,087 | | 3,266,087 | 1,083,913 | 25 | ජාතික අයවැය චක්‍රලේඛ 01/2023 අනුව ඉතිරි කිරීම |
| 1409 වෙනත් | | 11 | 80,000,000 | 1,200,000 | | 81,200,000 | 67,167,588 | | 67,167,588 | 14,032,412 | 17 | ජාතික අයවැය චක්‍රලේඛ 01/2023 අනුව ඉතිරි කිරීම හා රාජ්‍ය වියදම් පාලනය කිරීම. |
| **එකතුව ( ඈ )** | | | **131,550,000** | **1,200,000** | **4,160,000** | **136,910,000** | **115,568,122** | **-** | **115,568,122** | **21,341,878** | | |
| **අනෙකුත් භාණ්ඩ හා සේවා සඳහා මුළු වියදම (අ+ආ+ඇ+ඈ)** | | | **285,000,000** | **1,200,000** | **(640,000)** | **285,560,000** | **233,931,216** | **-** | **233,931,216** | **51,628,784** | | |

ඒසීඒ-2(ii)

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය :261 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගාල්ල

රු.

| වැය විෂයය | සටහන | මූල්‍යකරණ සංකේත අංකය | ප්‍රතිපාදනය: වාර්ෂික අයවැය ගත ප්‍රතිපාදන | ප්‍රතිපාදනය: පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | ප්‍රතිපාදනය: මු.රෙ. 66/69 මාරු කිරීම් | ප්‍රතිපාදනය: මුළු ශුද්ධ ප්‍රතිපාදන | වියදම: මුදල් පොතට අනුව වියදම | වියදම: මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව) | වියදම: මුළු වියදම | ශුද්ධ බලපෑම: ඉතිරිය /ඉක්මවීම් | ශුද්ධ බලපෑම: ඉතිරිය(ඉක්මවීම්) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස | ශුද්ධ බලපෑම: වෙනස්කම්වලට හේතු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | (1) | (2) | (3) (-)/+ | (4)=(1)+(2)+(3) | (5) | (6) | (7)= (5)+(6) | (8)=(4)-(7) | (9)=(8)/(4)*100 | |
| **වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද මාරුකිරීම් , ප්‍රදානයන් සහ සහනාධාර** | 7 | | | | | | | | | | | |
| **<u>මාරුකිරීම්</u>** | | | | | | | | | | | | |
| 1504 සංවර්ධන සහනාධාර | | | | | | - | | | - | - | | |
| සහල් මිළදී ගැනීමේ වැඩසටහන | | | | 12,046,000 | | 12,046,000 | 12,010,054 | | 12,010,054 | 35,946 | | |
| 1506 රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොළී | | 11 | 16,000,000 | | | 16,000,000 | 11,107,278 | | 11,107,278 | 4,892,722 | 31 | ජාතික අයවැය චක්‍රලේඛ 01/2023 අනුව ඉතිරි කිරීම් |
| 1508 වෙනත් | | | | | | - | | | | | | |
| හෝල් ඩි ගෝල් | | 11 | 5,000,000 | | 640,000 | 5,640,000 | 5,059,321 | | 5,059,321 | 580,679 | 10 | දෙසැම්බර් මස බිල්පත් ඉදිරිපත් නොවීම. |
| **එකතුව** | | | **21,000,000** | **12,046,000** | **640,000** | **33,686,000** | **28,176,653** | **-** | **28,176,653** | **5,509,347** | | |
| <u>වැඩසටහන (1)</u> **මුළු පුනරාවර්තන වියදම්වල එකතුව (සටහන 5-9)** | | | **2,052,000,000** | **13,246,000** | **-** | **2,065,246,000** | **1,957,822,298** | **13,623,845** | **1,971,446,143** | **93,799,857** | | |

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය

ඒසීඒ-2(ii)

වියදම් ශීර්ෂ අංකය :261

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගාල්ල

රු.

| වැය විෂයය | සට හන | මූලාශ්‍ර සංකේත අංකය | ප්‍රතිපාදනය: වාර්ෂික අයවැය ගත ප්‍රතිපාදන (1) | ප්‍රතිපාදනය: පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | ප්‍රතිපාදනය: මු.රෙ. 66/69 මාරු කිරීම (3) (-)/+ | ප්‍රතිපාදනය: මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | වියදම: මුදල් පොතට අනුව වියදම (5) | වියදම: මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව) (6) | වියදම: මුළු වියදම (7)= (5)+(6) | ශුද්ධ බලපෑම: ඉතිරිය /ඉක්මවීම (8)=(4)-(7) | ශුද්ධ බලපෑම: ඉතිරිය(ඉක්මවීම) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස (9)=(8)/(4)*100 | වෙනස්කම්වලට හේතු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මූලධන වියදම් | | | | | | | | | | | | |
| වැඩසටහන (1) | | | | | | | | | | | | |
| **වැය විෂය අනුව රාජ්‍ය ආයෝජන වියදම් වර්ගීකරණය** | | | | | | | | | | | | |
| **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | 10 | | | | | | | | | | | |
| 2001 ගොඩනැගිලි සහ ඉදිකිරීම් | | 11 | 30,000,000 | | | 30,000,000 | 17,044,703 | | 17,044,703 | 12,955,297 | 43 | ජාතික අයවැය චක්‍රලේඛ 02/2023 අනුව අත්‍යාවශ්‍ය අලුත්වැඩියාවන් පමණක් සිදුකිරීම. |
| 2002 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | | 11 | 4,000,000 | | | 4,000,000 | 3,933,349 | | 3,933,349 | 66,651 | 2 | අනියම් ඉතිරිවීම |
| 2003 වාහන | | 11 | 20,000,000 | | | 20,000,000 | 9,144,851 | | 9,144,851 | 10,855,149 | 54 | ජාතික අයවැය චක්‍රලේඛ 02/2023 අනුව අත්‍යාවශ්‍ය අලුත්වැඩියාවන් පමණක් සිදුකිරීම. |
| **එකතුව (අ)** | | | **54,000,000** | - | - | **54,000,000** | **30,122,903** | - | **30,122,903** | **23,877,097** | | |
| **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | 11 | | | | | | | | | | | |
| 2102 ගෘහභාණ්ඩ හා කාර්යාලයීය උපකරණ | | 11 | 500,000 | | | 500,000 | 490,350 | | 490,350 | 9,650 | 2 | අනියම් ඉතිරිවීම |
| 2103 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | | 11 | 500,000 | | | 500,000 | 490,600 | | 490,600 | 9,400 | 2 | අනියම් ඉතිරිවීම |
| 2104 ගොඩනැගිලි සහ ඉදිකිරීම් | | 11 | 15,000,000 | | | 15,000,000 | 2,833,842 | | 2,833,842 | 12,166,158 | 81 | ජාතික අයවැය චක්‍රලේඛ 02/2023 අනුව අත්‍යාවශ්‍ය ඉදිකිරීම් පමණක් සිදුකිරීම. |
| **එකතුව (ආ)** | | | **16,000,000** | - | - | **16,000,000** | **3,814,792** | - | **3,814,792** | **12,185,208** | | |

ඒසීඒ-2(ii)

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගාල්ල

වියදම් ශීර්ෂ අංකය :261

රු.

| වැය විෂයය | සටහන | මූල්‍යකරණ සංකේත අංකය | ප්‍රතිපාදනය: වාර්ෂික අයවැය ගත ප්‍රතිපාදන | ප්‍රතිපාදනය: පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | ප්‍රතිපාදනය: මු.රෙ. 66/69 මාරු කිරීම | ප්‍රතිපාදනය: මුළු ශුද්ධ ප්‍රතිපාදන | වියදම: මුදල් පොතට අනුව වියදම | වියදම: මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව) | වියදම: මුළු වියදම | ශුද්ධ බලපෑම: ඉතිරිය /ඉක්මවීම | ශුද්ධ බලපෑම: ඉතිරිය(ඉක්මවීම) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස | ශුද්ධ බලපෑම: වෙනස්කම්වලට හේතු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | (1) | (2) | (3) (-)/+ | (4)=(1)+(2)+(3) | (5) | (6) | (7)= (5)+(6) | (8)=(4)-(7) | (9)=(8)/(4)*100 | |
| ප්‍රාග්ධන මාරුකිරීම | 12 | | | | | | | | | | | |
| මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | | | | | | | | | | | |
| හැකියා වර්ධනය | 14 | | | | | | | | | | | |
| 2401 කාර්ය මණ්ඩල පුහුණු | | 11 | 6,000,000 | | | 6,000,000 | 1,304,008 | | 1,304,008 | 4,695,992 | 78 | ජාතික අයවැය චක්‍රලේඛ 02/2023 අනුව අත්‍යාවශ්‍ය පුහුණු කිරීම් පමණක් සිදුකිරීම. |
| **එකතුව (ඉ )** | | | **6,000,000** | **-** | **-** | **6,000,000** | **1,304,008** | **-** | **1,304,008** | **4,695,992** | | |
| වෙනත් මූලධන වියදම් | 15 | | | | | | | | | | | |
| ගම සමග පිළිසඳරක්-ග්‍රාමීය සංවර්ධන වැඩසටහන | | | | | | | | | | | | |
| 2509-වෙනත් | | | | | | | | | | | | |
| 2011-2014 මාර්ග කාපට් අතැති බිල් | | 11 | | 16,900,000 | | 16,900,000 | 11,969,611 | | 11,969,611 | 4,930,389 | 29 | ගෙවීම් කරන ලද ව්‍යාපෘතින්හි අය නොවූ අත්තිකාරම් අයකරගැනීම,කළ වැඩ වටිනාකම අඩුවීම හා ඒ අනුව VAT ගෙවීම අඩුවීම |
| **එකතුව (ඊ)** | | | **-** | **16,900,000** | **-** | **16,900,000** | **11,969,611** | **-** | **11,969,611** | **4,930,389** | | |
| වැඩසටහන (1) | | | | | | | | | | | | |
| **රාජ්‍ය ආයෝජනයන්හි මුළු වියදම (අ+ආ+ඇ+ඈ+ඉ+ඊ)** | | | **76,000,000** | **16,900,000** | **-** | **92,900,000** | **47,211,314** | **-** | **47,211,314** | **45,688,686** | | |
| **මුළු වියදම්වල එකතුව (සටහන 5-15)** | | | **2,128,000,000** | **30,146,000** | **-** | **2,158,146,000** | **2,005,033,612** | **13,623,845** | **2,018,657,457** | **139,488,543** | | |

..........................

ප්‍රධාන ගණකාධිකාරි

දිනය : 15. 02. 2024

ඩී.එස්. රණසිංහ

ප්‍රධාන ගණකාධිකාරි

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

ගාල්ල.

## 2023 වර්ෂය සඳහා අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගාල්ල**
**වියදම් ශීර්ෂ අංකය :261**

රු.

| අග්‍රිම ගිණුම් අංකය | 2023 ජනවාරි 01 දිනට අග්‍රිම ශේෂය 1 | | | අග්‍රිම ලැබීම් 2 | | | අග්‍රිම පියවීම 3 | | | 2023 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය 4 | | | 2023 දෙසැම්බර් 31 දිනට ආයතන පොත් අනුව | 2023 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නොපියවූ උප අග්‍රිම | නොපියවූ අග්‍රිම (නොපියවූ උප අග්‍රිම හැර) | එකතුව | භාණ්ඩාගාරයෙන් | වෙනත් මූලාශ්‍රවලින් | එකතුව | වියදම් මගින් | මුදල් මගින් | එකතුව | නොපියවූ උප අග්‍රිම ශේෂය | නොපියවූ අග්‍රිම ශේෂය | එකතුව | *5 | 6 |
| | 1(i) | 1(ii) | 1(iii) | 2(i) | 2(ii) | 2(iii)=2(i)+2(ii) | 3(i) | 3(ii) | 3(iii)=3(i)+3 (ii) | 4(i) | 4(ii) | 4(iii)=4(i)+4(ii) | 5=1(iii)+2(iii) -3(iii) | |
| 308/21 | 115,536 | - | 115,536 | | | | - | 115,536 | 115,536 | | | | | |
| 308/23 | | | | 4,823,542,285 | 495,213,466 | 5,318,755,751 | 5,318,755,751 | | 5,318,755,751 | | | | | |

**1. ඉහත 4 හා 6 ශේෂ අතර වෙනසට හේතු පෙන්වන්න**

(1) ප්‍රේෂණය කරන ලද නමුත් භාණ්ඩාගාර පොත්වල නොපෙනෙන 2023.12.31 දිනට මුදල් ශේෂය -

(2) වෙනත් හේතු - .................................................... -

-

**මෙම ශේෂ වාර්තාව අත්සන් කරන දින වන විට පියවා ඇත්නම් ඒ බව ද , නොඑසේ නම් නොපියවීමට හේතු සඳහන් කරන්න .**

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

..............................
ප්‍රධාන ගණකාධිකාරී
දිනය : 15. 02. 2024

ඩී.එස්. රණසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
ගාල්ල.

* මෙම ශේෂය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි පෙන්විය යුතු ය.

ඒසීඒ -4

# 2023 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

**වියදම් ශීර්ෂ අංකය :261** **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගාල්ල**

රු.

| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව,වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදි හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වු හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබු ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | ගාල්ල කඩවත් සතර (ග්‍රාම නිලධාරී) වීරසිංහ මයාගේ ආපදා ණය රු.108,248 | නීතිමය ක්‍රියා මාර්ග ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂ අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම්** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | - | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්යමණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල නොවේ | ගාල්ල දිස්ත්‍රික් ලේකම් විසින් තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමක් සිදුනොකරන අතර ඒ ඒ පත්වීම් බලධාරීන් විසින් බඳවාගෙන අනුයුක්ත කල නිලධාරීන් සේවයේ යෙදවීම සිදු කර ඇත.පත්වීම් බලධාරීන් අනුමත සීමාව ඉක්මවා අනුයුක්ත කිරීම මත අතිරික්තය ඇති වන අතර ඒ සම්බන්ධයෙන් දිසාපතිවරුන්ට වගකීම භාරගත නොහැකි බව අදාල නිලධාරීන් වෙත ලිඛිතව දන්වා ඇත. | අතිරික්ත නිලධාරීන් පිළිබඳව හා පවතින පුරප්පාඩු පිළිබඳ තොරතුරු රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශය වෙත මාසිකව වාර්තා කරන බව කාරුණිකව දන්වමි. |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර , වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05 / 2008 හා 05 / 2008 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තියක්සම්පාදනය කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැ ස්ම තුළ තහවුරු කර තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

**************

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. SPCG/GL/A/GDS/2/2023/22 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2024 මැයි 15 දින.

දිස්ත්‍රික් ලේකම් 17 MAY 2024 ගාල්ල

දිස්ත්‍රික් ලේකම්,
ගාල්ල.

**ශීර්ෂය 261 - ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 261 - ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රත්පත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගාල්ල දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 15 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ

ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1(ඈ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු සියළුම වත්කම් තක්සේරු කර වටිනාකම ගිණුම් ගත කළ යුතුයි. | 1.6.2 (ආ) |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 පුනරාවර්තන වියදම්

1409 වැය විෂය සඳහා 2023 වර්ෂයට අදාල ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය රු.80,000,000 ක් වූ අතර 318 පරිපූරක අයවැය මගින්ද රු.1,200,000 ක ප්‍රතිපාදන වෙන්කරගෙන තිබුණි.ඒ අනුව ලද රු.81,200,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු.67,167,588 ක් වැයකර රු.14,032,412 ක් ඉතිරි වී තිබුණ බැවින් පරිපූරක ඇස්තමේන්තු මගින් වෙන් කර ගත් මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

### 1.6.2 මූල්‍ය නොවන වත්කම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත වෙනත් ශීර්ෂයන් ගෙන් ලැබුණ රු.2,280,547 ක් වටිනා මූල්‍ය නොවන වත්කම් නීත්‍යානුකූලව පවරා ගැනිමකින් තොරව ආයතනයේ වත්කම් යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 8 ක පැවති පාසල් 39 ක් වසා දමා වසර 5 ත් 24 ත් අතර කාලයක් ගතවී තිබුණද එම පාසල් නිසි පරිදි පවරා ගෙන ,මායිම් සලකුණු කිරීමේ කටයුතු හා පාසැලට අයත් ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කොට වත්කම් යටතේ ගිණුම් ගත කිරීමේ කටයුතු සිදු කර නොතිබුණි.

(ඇ) භාණ්ඩාගාර පොත් අනුව සමාලෝචිත වර්ෂයේ මෝටර් රථ , යන්ත්‍ර උපකරණ ආරම්භක ශේෂය රු.596,258,867 ක් වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් ලබා ගත් තොරතුරු අනුව ආරම්භක ශේෂය රු.594,712,012 ක් වුයෙන් රු.1,546,855 ක වෙනසක් නිරීක්ෂණය විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වසා දැමූ පාසලක් 2002 වර්ෂයේ සිට පෞද්ගලික පාසලක් පවත්වා ගෙන යාම සඳහා ලබා දී තිබූ අතර බදු ගිවිසුම්වලට එළඹ නොතිබීම හේතුවෙන් රජයට බදු අයවිය යුතු ආදායම් අහිමි වී තිබුණි.

(ආ) හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රජයේ ඉඩම් සඳහා දීර්ඝ කාලීන බදු අය කළ යුතු බදු කරුවන් 11 දෙනෙකුගෙන් අවුරුදු 8 සිට අවුරුදු 12 ක කාල සීමාවක් තුළ අයවිය යුතු රු.6,836,260 ක බදු මුදල් සහ රු.1,095,570 ක දඩ මුදල් 2023 දෙසැම්බර් 31 වන විටත් අයවිය යුතුව තිබුණි.

2.2 වියදම් කළමනාකරණය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) පුනරාවර්තන වැය විෂයයන් 11 ක ඉතිරිවීම් සියයට 11 ත් සියයට 52 ත් අතර ප්‍රතිශතයක පැවතුණි.

(ආ) මූලධන වැය විෂයයන් 5ක ඉතිරි වීම් සියයට 29 ත් සියයට 81 ත් අතර ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(ඇ) වැය විෂයන් 03 ක ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා වෙනත් වැය විෂයයන් 03 කින් සියයට 13 සිට සියයට 49 දක්වා පරාසයක ප්‍රතිපාදන මාරු කර වියදම් දරා තිබුණි.

(ඈ) වැය විෂයන් 02 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම නිසා එම ප්‍රතිපාදනයෙන් සියයට 04 සිට සියයට 20 දක්වා පරාසයක ප්‍රතිපාදන වෙනත් වැය විෂයන්ට මාරු කර තිබුණි.

(ඉ) වැය විෂයන් 3ක් සඳහා අවස්ථා 5කදී පරිපූරක ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණ අතර ඉන් වැය විෂය අංක 1409 සඳහා වෙන් කර ගන්නා ලද මුළු ප්‍රතිපාදනයෙන් සියයට 17 ක් ඉතිරි කර තිබුණි.

(ඊ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි අතිරික්ත කාර්ය මණ්ඩලයක් සේවයේ යෙදී සිටියදී සමාලෝචිත වර්ෂයේදී අතිකාල දීමනා ලෙස නිලධාරී කාණ්ඩ 4 ක් සඳහා රු. 1,117,806 ක ගෙවා තිබුණි.

(උ) 2024 මාර්තු මස විගණන අවස්ථාව වන විට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරිනියකට භාෂා දීමනා රු.133,605 ක් ගෙවා තිබූ අතර 2005 වර්ෂයේදී අදාල නිලධාරිනිය විසින් සිදුකරන ලද ඉල්ලීම රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශ නියෝජ්‍ය ආයතන අධ්‍යක්ෂ විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. 1998 දෙසැම්බර් 30 දිනැති අංක 29/98 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව ආයතන අධ්‍යක්ෂ වෙත කරුණු ඉදිරිපත් කර අවශ්‍ය පැහැදිලි කිරීම් ලබා ගැනීමකින් තොරව අතිරේක දිස්ත්‍රික් ලේකම් විසින් මෙම ගෙවීම අනුමත කර තිබුණි.

(ඌ) 2023 මැයි මාසයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංචිත වාහනයක පැරණි බැටරිය වෙනුවට නව බැටරියක් ස්ථාපනය කර තිබූ අතර පැරණි බැටරියේ වගකීම් සහතිකය අනුව බැටරියේ මිලෙන් සියයට 50 ක දායකත්වය යටතේ නව බැටරියක් ලබා දීමට නියෝජිතායතනය එකඟවී තිබුණි. ඒ අනුව නව බැටරිය සඳහා රු.48,697 ක් ගෙවීම් කර තිබුණි.බැටරි මිලගණන් පිළිබඳව සිදු කරන ලද වෙළඳපල පරීක්ෂාවේදී නිරීක්ෂණය වූයේ අදාල වෙළඳ නාමය සහිත බැටරියක 2023 මැයි මස වන විට වෙළඳපොළ මිල රු.65,986 ක් පමණක් වූ බවයි. මේ අනුව වෙළඳපොළ මිලට වඩා වැඩි වටිනාකමකට බැටරියෙහි මිල ලකුණු කොට ඉන් සියයට 50 ක වටිනාකමකට බැටරිය යෙදීම හේතුවෙන් රජයට සිදු වී තිබූ පාඩුව රු.44,000 ක් විය.

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

2023 දෙසැම්බර් මාසයට අදාල එකතුව රු.24,756 ක් වූ වියදම් බැඳීම් හා බැරකම් ප්‍රකාශයෙන් අත්හැරී තිබුණි.

## 2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

කාර්යාල 01කින් අමාත්‍යාංශ 18 කින් හා දෙපාර්තමේන්තු 23 කින් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට පිළිවෙලින් රු.1,021,675 ක් රු.2,491,940,703 ක් හා රු.538,651,395 ක් ලෙස එකතුව රු.3,031,613,773 ක් ප්‍රතිපාදන ලැබී තිබුණි. එම ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට පිළිවෙලින් රු 1,021,675 ක් රු. 2,491,301,880 ක් හා රු.538,605,495 ක් ලෙස එකතුව රු.3,030,929,050 ක් උපයෝජනය කර තිබුණි.ඒ අනුව පිළිවෙලින් රු.638,823 ක්ද හා රු.45,900 ක් ලෙස ප්‍රතිපාදනයෙන් එකතුව රු.684,723 ක් ඉතිරි කර තිබුණි.

## 2.5 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.4 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

## 2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත විස්තර දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | මුදල රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මු.රෙ. 104 | - | (i) නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් නිලසෙවණ කාර්යාල 02 ක සවි කොට තිබූ වතුර මෝටර් 02 ක් 2021 හා 2023 යන වර්ෂවලදී සොරකම් කර තිබුණි. 2023 ජූනි මස වන තෙක් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අලාභය හඳුනාගෙන ලේඛනගත කර නොතිබුණි.<br><br>(ii) සමාලෝචිත වර්ෂය තුල ප්‍රාදේශීය ලේකම් කාර්යාල හයක සිදු වූ වාහන අනතුරු සම්බන්ධයෙන් අවසන් වාර්තා නිකුත් කිරීමට 2024 අප්‍රේල් මස විගණන පරීක්ෂණ දිනය වන විටත් කටයුතු කර නොතිබුණි. |
| (ii) මු.රෙ. 880 හා ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 2022 මාර්තු 16 දිනැති අංක 04/2022 චක්‍රලේඛය | | බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ සැලසුම් හා සරප් විසින් ඇප තැන්පත් කර නොතිබුණි. |
| (ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | |
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 3.1 ඡේදය | | (i) සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කරුණු අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද |

හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු එක් වාහනයක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන 03ක ඉන්ධන පරීක්ෂාව 2024 මාර්තු මස වන විටත් සිදු කර නොතිබුණි.

2.7 තැන්පතු

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඊට අනුබද්ධ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 අදාලව 2023 දෙසැම්බර් 31 දිනට රු.201,731,887 ක් වූ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,455,816 ක වසර 10 ක් ඉක්ම වූ තැන්පතු ශේෂය සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවය කරනු ලබන විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ වන සංවර්ධන නිලධාරීන් වෙත පැවරී ඇති රාජකාරි අනුව බල ප්‍රදේශයේ විගමනික පවුල් හා විදේශ රටවල සේවය කර පැමිණි ශ්‍රමිකයන් පිළිබඳ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම, විගමනික පවුල් සඳහා පවුල් පසුබිම් වාර්තා ,සමාජ වාර්තා පවත්වාගෙන යෑම අවදානම් පවුල් සඳහා සංවර්ධන සැලසුම් සැකසීම, විගමනික පවුල්වල දරුවන්ගේ සුබසාධන කටයුතු අඛණ්ඩව සුපරීක්ෂණය හා

උපදේශනය කල යුතුය. වදුරඹ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් එම කටයුතු ඉටු වී නොතිබුනු අතර ප්‍රමාණවත් අධීක්ෂණයක් සහ සුපරීක්ෂණයක් සිදු කර නොතිබුණි.

3.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.9,943,748 ක් වියදමක් දරා තෝරාගත් ප්‍රතිලාභින් 323 දෙනෙකු හා එක් සෞභාග්‍යා නිෂ්පාදන සමිතියක් වෙත අගය එකතු කළ කුරුඳු නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා උපකරණ ලබා දී තිබුණි. 2023 සැප්තැම්බර් 08 දින සිදු කරන ලද විගණන ක්ෂේත්‍ර පරීක්ෂණයේදී සෞභාග්‍යා නිෂ්පාදන සමිතිය වෙත ලබා දී තිබූ රු.1,360,000 ක් වටිනා උපකරණ නිෂ්කාර්යව තිබුණු අතර රු.164,900 ක් වටිනා උපකරණ ප්‍රයෝජනයට නොගෙන ඇසුරුම් තුලම තිබුණි. ප්‍රතිලාභින් 6 දෙනෙකුට රු.597,000 ක් වටිනා කුරුඳු ඇඹරුම් යන්ත්‍ර ලබා දී තිබුණද ව්‍යාපෘතිය තුලින් අපේක්ෂා කළ කුරුඳු නිෂ්පාදන වෙළඳපළට එකතු කර නොතිබුණි.

(ආ) හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මාළු ආශ්‍රිතව අගය වැඩි දියුණු කරන ලද නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා තෝරාගත් ප්‍රතිලාභින් 50 දෙනෙකු වෙත ලබා දි තිබූ රු.5,070,995 ක් වටිනා උපකරණ නිෂ්කාර්යව තිබුණි. රු.20,190 ක් වටිනා උපකරණ ප්‍රයෝජනයට නොගෙන ඇසුරුම් තුළම තිබූ අතර ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කළ අරමුණු ඉටු වී නොතිබුණි.

(ඇ) බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අත්යන්ත්‍ර පේෂ කර්ම නිෂ්පාදන ව්‍යාපෘතියන් සඳහා තෝරාගත් ප්‍රතිලාභින් 20 දෙනෙකු වෙත රු.4,642,471 ක වියදමක් ද, රසකැවිලි හා කිරි නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා තෝරාගත් ප්‍රතිලාභින් 25 දෙනෙකු වෙත රු.368,416 ක වියදමක් ද දරා උපකරණ ලබා දී තිබුණි. 2023 නොවැම්බර් 16 විගණන පරීක්ෂාවට අනුව ප්‍රතිලාභින් 11 දෙනෙකු හා සෞභාග්‍යා අත්යන්ත්‍ර පේෂකර්ම ගොඩනැගිල්ල සඳහා ලබා දී තිබූ රු.845,265 ක් වටිනා උපකරණ ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කළ මට්ටමින් නිෂ්පාදන කටයුතු වල නොයෙදවීම හේතුවෙන් නිෂ්කාර්යව පැවතුණි .

(ඇ) තවලම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ විජලනය කල එළවළු ,පළතුරු, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා රු.539,241 ක වියදමක් දරා ප්‍රතිලාභින් හට උපකරණ ලබාදී තිබුණද 2023 ඔක්තොම්බර් මස වන විට සියළුම ප්‍රතිලාභින්ගේ ව්‍යාපෘති අක්‍රිය තත්වයේ පැවතුණි. මිරිදිය සහ විසිතුරු මත්ස්‍ය වගා ව්‍යාපෘතිය සඳහා රු.689,844 ක වියදමක් දරා තෝරාගත් ප්‍රතිලාභින් 20 ක් සඳහා භාණ්ඩ හා උපකරණ ලබා දී තිබුණි. 2023 ඔක්තෝම්බර් මස වන විට ඉන් ප්‍රතිලාභින් 8ක් අක්‍රිය තත්වයේ පැවති අතර එක් ප්‍රතිලාභියෙකු ව්‍යාපෘතියෙන් ඉවත් වී තිබුණි.ලබා දුන් සෙවිලි තහඩු අදාල ව්‍යාපෘතිය සඳහා භාවිතා කර නොතිබුණි.

(ඉ) 2020 වර්ෂයේ අධිකරණ මානව හිමිකම් සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙතින් තවලම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ කන්නෙලිය ඇලේ සිට මහබෝධිවත්ත දක්වා පැමිණ හිනිදුම මල්ලිකා විදුහල අවට ප්‍රදේශය දක්වා ජලය සැපයීමේ ව්‍යාපෘතිය සඳහා ලද රු.1,000,000 ක ප්‍රතිපාදන මුදලින් රු.802,650 ක් වටිනා ජලනල උපාංග මිළදී ගෙන තිබුණි. 2020 දෙසැම්බර් 30 දින ප්‍රාදේශිය ලේකම් හා තවලම ප්‍රාදේශිය සභාවේ සභාපති සමඟ ඇති කර ගත් ගිවිසුම ප්‍රකාරව ප්‍රාදේශිය සභාවේ සභාපති වෙත උපකරණ භාර දී තිබූ අතර 2021 පෙබරවාරි 09 දින ප්‍රාදේශිය සභාවේ සභාපති විසින් එම ජලනල උපාංග බාරගෙන තිබුණි. 2024 මාර්තු 26 විගණන ක්ෂේත්‍ර පරික්ෂණ අවස්ථාව වන විටත් මෙම ව්‍යාපෘතියේ කටයුතු ඉටුකර නොතිබුණු අතර ලබා දුන් ජල නල උපාංගද ප්‍රාදේශිය සභාව වෙත භාර දි නොතිබුණි.

### 3.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2021 වර්ෂයේදි ක්‍රියාත්මක සමෘද්ධි පවුල් ලක්ෂ දෙකක් කේන්ද්‍ර කර ගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ විගණනයට භාජනය කල ප්‍රාදේශිය ලේකම් කාර්යාල 10 ක ප්‍රතිලාභින් 1,250 ක් සඳහා රු 39,630,093 ක් වැය කර භාණ්ඩ හා උපකරණ බෙදා දී තිබුණද ඉන් ප්‍රතිලාභීන් 726 ක් සමාලෝචිත වර්ෂයේදී ද

අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම මත තව දුරටත් සමෘද්ධි සහනාධාර ගෙවමින් පැවතුණි.

(ආ) අස්වැසුම සුබසාධන ප්‍රතිලාභීන් හඳුනාගැනීමේ වැඩසටහනට අදාළව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 6 ක සමීක්ෂණ කටයුතු හා දත්ත ඇතුලත් කිරීමේ කටයුතු සඳහා රු.11,921,782 ක වියදමක් දරා තිබුණි. ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී සමීක්ෂණ දත්තවල නිවැරදිතාවය හඳුනානොගැනීම හා තොරතුරු විශ්ලේෂණ කමිටු වල සටහන් සැලකිල්ලට නොගැනීම හේතුවෙන් ප්‍රසිද්ධියට පත් කරන ලද ප්‍රතිලාභී නාම ලේඛනය සඳහා අභියාචනා 8116 ක් හා විරෝධතා 3563 ක්ද ඉදිරිපත් වී තිබූ අතර බැංකු ගිණුම් ආරම්භ නොකරන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1600 ක් පමණ විය.

(ඇ) වදුරඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද සමෘද්ධි සහනාධාරලාභී ඉහළ කාණ්ඩයේ ප්‍රතිලාභීන් 25 ක් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂය තුළ රු ප්‍රතිලාභීන් 43 ක් වෙනුවෙන් රු.2,294,618 ක වියදමක් දරා තිබූ අතර ප්‍රතිලාභීන් 25 ක් පිලිබඳව සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂාවේදී 14 දෙනෙකු සමාලෝචිත වර්ෂයේදිද සමෘද්ධි ප්‍රතිලාභ ලබාගෙන තිබුණි. ප්‍රතිලාභීන් 05 ක් වෙත ලබාදුන් රු.28,520 ක් වටිනා භාණ්ඩ හා උපකරණ අදාළ ව්‍යාපෘතිය සඳහා භාවිතා කර නොතිබුණි.

(ඈ) වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රතිලාභීන් 39 දෙනෙකු වෙත ගල් කැටයම් හා කළුගල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා උපකරණ හා වැඩබිම් සකස් කිරීම සඳහා උපකරණ ලබාදීම වෙනුවෙන් රු.3,790,838 ක් වැය කර තිබුණි. 16 දෙනෙකුගේ නියැදියකින් සිදුකල පරීක්ෂණ අවස්ථාවේ ප්‍රතිලාභීන් 07 ක් සඳහා ලබාදුන් රු.234,300 ක් වටිනා වැඩබිම් සකස් කිරීමේ උපකරණ හා එක් ප්‍රතිලාභියෙකු වෙත ලබාදුන් රු.35,040 ක් වටිනා අනෙකුත් උපකරණද භෞතිකව නිරීක්ෂණය නොවුණි. ප්‍රතිලාභීන් දෙදෙනෙකු වෙත ලබාදුන් උපකරණ කිසිදු භාවිතයකින් තොරව ඇසුරුම තුලම පැවතුණි.

### 3.1.4 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද ගම සමග පිළිසඳරක් ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති 1318 ක් අනුමත කර ව්‍යාපෘති 93 ක වැඩ අවසන් කර තිබුණු අතර වර්ෂය තුළ ව්‍යාපෘති සඳහා අනුමත රු.87,667,993 ක ප්‍රතිපාදනයෙන් රු.47,951,343 ක් උපයෝජනය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සම්බන්ධව සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී ග්‍රාම නිලධාරී වසම් දෙකක ප්‍රතිලාභීන් 05 ක් වෙත ලබාදුන් උපකරණ භාවිතයෙන් තොරව තබාගෙන ඇති බවත් ප්‍රතිලාභීන් වෙනත් කර්තව්‍යයන් වල නිරතවන බවත්, එක් ග්‍රාම නිලධාරී වසමකට ප්‍රතිලාභීන් 02 කට ලබාදුන් කුකුළු පැටවුන් සියල්ල මිය ගොස් තිබුණු අතර එක් වරක්වත් බිත්තර ලබා ගැනීමට නොහැකි වී තිබුණු බවත් නිරීක්ෂණය විය.

(ආ) අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද එක් ගමකට එක් ව්‍යවසායකයකු බිහි කිරීමේ ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභීන් 23 දෙනෙකු වෙනුවෙන් රු.1,545,798 ක රජයේ ආයෝජනයක් දරා තිබුණි. ප්‍රතිලාභීන් 6 ක් වෙත ලබා දුන් රු.348,000 ක් වටිනා විජලන යන්ත්‍රවල විජලන ධාරිතාව සීමා වීම හා විදුලි බල පරිභෝජන වියදම ඉහළ යාම හා තරඟකාරී නිෂ්පාදකයින්ට සාපේක්ෂව පිරිවැය ඉහළ යාම හේතුවෙන් ව්‍යාපාරික කටයුත්තක් ලෙස යොදා ගැනීමට නොහැකි වී තිබුණි.

### 3.2 ප්‍රසම්පාදනය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහන වල වාර සේවාවන් සඳහා 2023 වර්ෂයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමකින් තොරව ලියාපදිංචි සැපයුම්කරුවන් 8 ක් අතුරින් සැපයුම් කරුවන් 4 ක් වෙත යොමුකර තිබුණි.

### 3.3 අනාර්ථික ගනුදෙනු

වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද සෞභාග්‍යා නිෂ්පාදන ගම්මානය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ රු.2,686,465 ක වියදමක් දරා ගල්කැටයම් ප්‍රතිලාභීන්ට අමුද්‍රව්‍ය සපයා ගැනීමට ළඟා වීම සඳහා

මාර්ගයක් සකස් කර තිබුණි. මාර්ගය සකස් කිරීමේදී ඇස්තමේන්තු ප්‍රකාරව මීටර් 130 ක ප්‍රමාණයෙහි ගල් පිරවීම සඳහා රු.450,512 ක් ගෙවීම් කර තිබුණි. මාර්ගය සකස් කිරීම සඳහා භාවිතා කරන ලද විවිධ ප්‍රමාණයේ කැණීම් යන්ත්‍ර 02 ක් සහ රෝල යන්ත්‍රය භාවිත කිරීම පිළිබඳ මීටර් කියවීම් නිසි ලෙස පිළියෙල කර නොතිබියදී යන්ත්‍ර වෙනුවෙන් රු.770,310 ක් ගෙවීම් කර තිබුණි. මාර්ගය හරහා සවි කරන ලද හියුම් පයිප්ප මීටර් 48.78 ක් සඳහා රු.258,793 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් කර තිබුණද විගණන භෞතික පරීක්ෂණ අවස්ථාවේදී නිරීක්ෂණය වූයේ මීටර් 14.63 ක් පමණක් වූ හියුම් පයිප්ප පමණි. 2023 ජූලි 13 දින විගණන ක්ෂේත්‍ර පරීක්ෂණ අවස්ථාව වන විට මාර්ගය භාවිතයෙන් තොරව පැවතුණි.

### 3.4 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඊට අනුබද්ධිත ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 වෙත 2023 හා 2024 වර්ෂ තුළ විගණන විමසුම් පිළිවෙලින් 74 ක් සහ 38ක් නිකුත් කර තිබුණද, 2024 වර්ෂය තුළ නිකුත් කරන ලද විගණන විමසුම් 15 කට අදාළව 2024 මාර්තු 31 දින වන විටත් පිළිතුරු ලැබී නොතිබුණි.

### 3.5 කළමනාකරණ දුර්වලතා

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) නියාගම ප්‍රාදේශිය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ චාර්ල්ස් මාවත පළමුවන පටුමග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.496,232 ක වියදමක් දරා මාර්ගය කොන්ක්‍රිට් කර තිබූ අතර අවස්ථා 2දීම ලබා ගත් කොන්ක්‍රිට් සාම්පල් 8 ම අසමත්ව තිබියදී 2023 අගෝස්තු 25 දිනට රු.216,797 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) 2022 වර්ෂයේ ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ රු.275,000 ක ඇස්තමේන්තු පිරිවැයකට අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙහි තල්ගස්ගොඩ නිල සෙවණ කාර්යාලය ඉදිකර තිබූ අතර 2022 පෙබරවාරි 25 ගිවිසුම් ගතවූ ව්‍යාපෘතිය 2022 මාර්තු 30 දින වන විට වැඩ අවසන් කල යුතුව තිබුණි. තාක්ෂණික නිලධාරීන්ගේ 2022 මාර්තු 8 දිනැති ලිපිය ප්‍රකාරව වැඩ ආරම්භ කර තිබුණේ මාර්තු 08 දින දීය. වෙළඳපොල මිල ඉහළයාම මත ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා භාවිතා කළ යුතු නව මිල ගණන් 2022 මාර්තු 14 දිනෙන් පසුව භාවිතා කිරීමට දිස්ත්‍රික් ලේකම්ගේ 2022 මාර්තු 08 දිනැති

DSG/ENG/03/04/03 ලිපිය මගින් අවසර දී තිබුණි. කොන්ත්‍රාත්කරුගේ දුර්වලතාවය මත වැඩ ආරම්භ කිරීමට ප්‍රමාද වූ මෙම ව්‍යාපෘතියට ගෙවීම් කිරීමේදී කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු මිල ගණන් තාක්ෂණික නිලධාරීන් විසින් නව මිල ගණන් අනුව සකසා ගෙවීම් කිරීමත්, රඳවා ගනු ලබන සියයට 5ක මුදලද කොන්ත්‍රාත්කරු විසින් ලබා ගැනීමත් නිසා රු.42,783ක අමතර ගෙවීමක් සිදුකර තිබුණි.

(ඇ) අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2020 යටතේ පින්නදූව පටුමගේ 4 වන අතුරු මාර්ගයේ ඇති සැපයුම් විදුලි කණු පාර මැදින් අයිනට කර පැති කාණු ගොඩනැංවීමේ ව්‍යාපෘතිය සඳහා රු.600,000 ක ඇස්තමේන්තු ගත මුදලකට ගිවිසුම් ගතවී තිබුණි. ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සිදු කල කොන්ක්‍රීට් ඝණක සාම්පල් 8 න් සාම්පල් 6ක්ම අවශ්‍ය සම්පීඩක ශක්තිය නොතිබුණු අතර රුහුණු විශ්ව විද්‍යාලය මගින් පරීක්ෂාවන් සිදු කල කොන්ක්‍රීට් ඝණක සාම්පල් 3කම අවශ්‍ය සම්පීඩන ශක්තියෙන් තොරව තිබියදී 2020 දෙසැම්බර් 31 දින රු.496,959 ක්වූ බිල්පත් වටිනාකමින් රු.383,375 ක් ගෙවා තිබුණි.

(ඈ) ගෝනාපිනූවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේ නිවාඩු දින වැටුප් ගෙවීමේදී ආයතන සංග්‍රහයේ viii වන පරිච්ඡේදයේ 10 වෙනි වගන්තිය ප්‍රකාරව වැඩකල කාලය පැය 8කට නොඅඩු බව සනාථ කර ගැනීමකින් තොරව බහුමානතා සහතිකයක් පදනම් කරගනිමින් නිලධාරීන් දෙදෙනෙකු සඳහා නිවාඩු දින වැටුප් රු.178,648 ක්ද ගමන් වියදම් රු.127,140 ක් ලෙසද ගෙවා තිබුණි.මෙම නිවාඩු දින වැටුප් තුළ ඇතුළත් රු.10,530 ක් සතියේ වැඩකරන දිනයක් සහ ඉටුකළ රාජකාරියක් නොමැති සති අන්ත දිනයක් ද තිබුණි.

(ඉ) ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යංශයේ ප්‍රතිපාදන යටතේ 2021 වර්ෂයේදී ගෝනාපිනූවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද මානම්පිට ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.1,340,738 ක් වැය කර තිබුණි. 2024 ජනවාරි 23 දින විගණන භෞතික පරීක්ෂණ අවස්ථාව වන විට ක්‍රීඩා පිටිය වල්බිහිවී භාවිතයට ගත නොහැකි තත්වයට පත්ව තිබුණි.

(ඊ) තවලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද මාර්ග සම්බන්ධව නියැදි පරීක්ෂාවේදී මාර්ග 10 ක ඇස්තමේන්තු පිළියෙල කිරිමට පාදක කරගත් මිල අනුපාතයන් පැහැදිලි ලෙස දක්වා නොතිබුණි. පාදක කරගත් මිලගණන් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ 2021 වර්ෂයේ මිල ගණන් සමඟ නොගැලපීම හේතුවෙන් රු.1,609,731 ක අධි ගෙවීමක් පැවතුණි.එසේම නියැදි පරීක්ෂාවට ලක් කරන ලද මාර්ග දෙපස ගස් සිටුවීම සඳහා රු.80,000 ක වියදමක් දරා තිබුණු අතර විගණන පරීක්ෂාවට ලක් කරන ලද ව්‍යාපෘතිවල තත්ත්ව පරීක්ෂණ වාර්තා අසමත්ව තිබියදී රු.4,861,021 ක මුදලක් ගෙවීම් කර තිබුණි.

(උ) බදු අනුමැතිය ලබා ගැනීම සඳහා බදු කරුවන් 36 දෙනෙකුට අදාල ලිපි ගොනු හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දකුණු පළාත් ඉඩම් කොමසාරිස් වෙත යොමු කර විගණිත දිනය වූ 2023 සැප්තැම්බර් 21 දින වන විට වසර 1 සිට වසර 6 දක්වා කාලයක් ඉක්ම ගොස් .තිබුණද බදු අනුමැතිය ලැබී නොතිබුණි. ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2021 ඔක්තෝම්බර් 22 දිනැති අංක 2021/06 දරණ චක්‍රලේඛය ප්‍රකාරව දළ තක්සේරුවක් පදනම් කර ගනිමින් නියමිත ප්‍රතිශතයන්ට අනුව වාර්ෂික බදු මුදල් ගණනය කර නොතිබුණි.

(ඌ) නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2021 වර්ෂයේ මැයි මස ඇතිවූ ගංවතුර නාය යෑම් හා අධි අවදානම් හේතුවෙන් පදිංචි ස්ථානයන් ඉවත් කරන ලද පුද්ගලයන් නැවත පදිංචි කිරිම වෙනුවෙන් පවුල් 17 සඳහා රු.18,285,000 ක මුදලක් ගෙවා තිබූ අතර ගොඩනැගිලි සැලසුම් සඳහා පලාත් පාලන ආයතනයේ අනුමැතිය නොමැතිව ප්‍රතිලාභීන් 6කට රු.8,400,000 ක වන්දි මුදල් නිදහස් කර තිබුනි. නිවාස සම්පූර්ණ කිරීමෙන් පසු වාරිකය නිදහස් කිරීමේදී යෝග්‍යතා සහතිකය ලබා ගන්නා තෙක් රු.25,000 ක මුදලක් රඳවා ගත යුතු වුවද ඒ පිළිබඳව නොසලකා සහතිකය ලබා ගැනීමකින් තොරව සම්පූර්ණ මුදලම නිදහස් කර තිබුණි.

(එ) තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි 2017 වර්ෂයේ සිදු වූ ගංවතුර හා නාය යෑම් හේතුවෙන් අවතැන් වූවන් නැවත පදිංචි කිරිම සඳහා ප්‍රතිලාභීන් 58ක් හඳුනාගෙන තිබුණි. ප්‍රතිලාභීන් 16 ක් තෝරාගත යුතු විකල්ප අවස්ථාවක් ඉදිරිපත් කර නොතිබුණු අතර ඉන් 14 ක් අවදානම් ස්ථාන වලම පදිංචි වී සිටි බව නිරීක්ෂණය විය. ප්‍රතිලාභීන් තිදෙනෙකු වෙනුවෙන් 2023

දෙසැම්බර් වන විට රු.2,598,000 ක් ගෙවා තිබුණද එම ව්‍යාපෘති අවසන් වී නොතිබුණි.නැවත පදිංචි කිරීමේ මාර්ගෝපදේශයන්ට පටහැනිව නිවාස සැලසුම් සඳහා පලාත් පාලන ආයතනයේ හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ප්‍රතිලාභීන් 10 කට පළමු වාරිකය නිදහස් කර තිබුණි.පලාත් පාලන ආයතනය වෙතින් අනුකූලතා සහතිකය නිකුත් කරන තෙක් අවසන් වාරිකය ගෙවීමේදී රු.25,000 ක රැඳවුම් මුදලක් තබා ගත යුතු වුවද ප්‍රතිලාභීන් 7 ක් සම්බන්ධව එලෙස කටයුතු නොකොට අවසන් වාරිකය ගෙවා තිබුණි.

(ඒ) බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුල 2017 වර්ෂයේ නායයෑම් අධිඅවදානම් තත්වයට පත්වූ ප්‍රතිලාභීන් දෙදෙනෙකු නැවත පදිංචි කිරීමේ කටයුතු 2023 දෙසැම්බර් 20 වන විටත් අවසන් කර නොතිබුණු අතර එක් ප්‍රතිලාභියෙකු සඳහා රු.400,000 ක් ගෙවීම් කර තිබුණි. 2023 ජනවාරි 16 සිට 2023 දෙසැම්බර් 13 දක්වා කාලයේදී සිදුවූ අධික වර්ෂාව හේතුවෙන් ආපදාවට ලක් වූ නිවාස 43ක ආපදා තක්සේරු වටිනාකම රු.1,664,464 ක් වූ අතර ගෙවා තිබුනේ මින් රු.374,533 ක අත්තිකාරම් මුදලක් පමණි.මෙම කාලය තුල ආපදාවට ලක් වූ නිවාස 8 ක් වෙනුවෙන් සිදුවූ ආපදා තක්සේරු වටිනාකම රු.1,733,038 ක් වුවද ඒ සඳහා අත්තිකරම් මුදල් හෝ ගෙවා නොතිබුණි.

(ඔ) මාදම්පාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ගම සමඟ පිළිසඳරක් -2022 වැඩසටහන යටතේ සමාජ සුබසාධනය හා සමාජ සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක කර තිබූ සංවර්ධන ව්‍යාපෘති අතරින් නියැදියක් ලෙස තෝරා ගත් ව්‍යාපෘති 5 කින් ව්‍යාපෘති 3 කද , යටිතල පහසුකම් සංවර්ධනය යටතේ ක්‍රියාත්මක කර තිබූ එක් ව්‍යාපෘතියකද ගිවිසුම් ගත වූ දිනෙන් පසු දිනයන්වලට බල පැවැත්වෙන මිල ගණන් භාවිතා කර ගෙවීම නිසා රු.324,280 ක අධි ගෙවීමක් නිරීක්ෂණය විය.

(ඕ) රත්ගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් කුලියට ගැනීමේදී රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් රු.250,000 කට මාසික තක්සේරු කුලිය ලබා දී තිබියදී ඒ පිළිබඳව නොසලකා හැර ප්‍රාදේශීය ලේකම් විසින් පත් කරන ලද කමිටුවක් විසින් ලබා දුන් කුලී වටිනාකම පදනම් කර ගනිමින් මාසික කුලිය රු.325,000 බැගින් වසර 4 ක් දක්වා

කුලියට ගැනීමට ගිවිසුම් ගත වී තිබුණි. මේ ලෙසටම බදු ගැනීම පිළිබඳව කොන්ත්‍රාත්කරු වෙත දැනුම් දීමටත් ප්‍රථම පැරණි ගොඩනැගිල්ලෙන් ගලවා ඉවත් කරන ලද Partition කොටස් සහ පළාත් සභාව වෙතින් ලබාගත් ලිපිගොනු කැබිනට් නව ගොඩනැගිල්ල වෙත ගෙනගොස් තිබුණි.

(ක) කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ වසර 20 ත් 24 ත් අතර කාල පරාසයක් තුළ වසා දමන ලද පාසල් 03ක් හා 2024 මාර්තු 30 දින වන විටත් නීත්‍යානුකූලව පවරා ගැනීමට , භූමි සීමා නිරවුල් කොට මායිම් සලකුණු කිරීමට හා පාසලට අයත් ඉඩම් හා ගොඩනැගිලි නිසි පරිදි තක්සේරු කොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වත්කම් යටතේ ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ග) ගම සමඟ පිලිසඳරක් වැඩ සටහන යටතේ ක්‍රියාත්මක ජීවනෝපාය සංවර්ධන වැඩසටහන මඟින් රු.362,600 ක් වැය කර ප්‍රතිලාභීන් 12 ක් වෙත කුකුල් පැටවුන් 740 ක් ලබා දී තිබූ අතර 2023 නොවැම්බර් විගණන අවස්ථාව වන විටත් ඉන් කිකිලි පැටවුන් 701 ක් මිය ගොස් තිබුණි. මිල ගණන් කැදවීමේ කොන්දේසි ප්‍රකාරව කිකිළි පැටවුන් එන්නත් කිරීම සම්බන්ධ අදාල ලේඛන ඉදිරිපත් කළ යුතු වුවත් එවැනි ලේඛන කිසිවක් මිල කියුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

(ච) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු සංචිත වාහනයක් 2019 වර්ෂයේ සිට අක්‍රිය තත්වයේ පැවති අතර 2023 දෙසැම්බර් මාසයේදී මෙම රථය අළුත්වැඩියා කිරීම සඳහා ගරාජයක් වෙත භාර දී තිබූ අතර 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව වාහනයේ අභ්‍යන්තර හා බාහිර අළුත් වැඩියාවන් නිශ්චිත ලෙස හඳුනාගෙන නොතිබුණු අතර අභ්‍යන්තර අළුත්වැඩියාවක් සඳහා සුදුසුකම් ලත් යාන්ත්‍රික ඉංජිනේරු වාර්තාවක් ලබා ගෙන නොතිබුණි.අළුත්වැඩියාවට අදාල නිර්දේශ ලබා ගැනීම සඳහා 2019 නොවැම්බර් සිට 2023 දෙසැම්බර් දක්වා කාලයක් ගත කිරීම හේතුවෙන් අළුත්වැඩියා වියදම් ඉහළ යෑම මත අදාල වාහනය කාර්යක්ෂම හා ඵලදායී මහජන සේවාවක් සඳහා යොදවා ගැනීමට තිබුණු අවස්ථාවන්ද මගහැරී තිබුණි.

(ජ) ඉන්ධන ඇණවුම් කිරීමේ ලේඛණය අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විදුලි ජනක යන්ත්‍රයෙහි 2024 පෙබරවාරි 20 දිනට ධාවනය කළ මුළු පැය ගණන 184 ක් වුවද යන්ත්‍රය අනුව සත්‍ය ලෙසම ධාවනය කළ පැය ගණන 1788 ක් පමණක්ව තිබියදී ඉන්ධන ලේඛනයේ ධාවන පැය අනුව ඉන්ධන නිකුත් කර තිබුණි. පසුගිය වසර 5ක් තුළ විදුලි ජනක යන්ත්‍රය ධාවනය වූ පැය ගණන අනුව එක් පැයකට සාමාන්‍ය ඉන්ධන පරිභෝජනය ලීටර 25 සිට ලීටර 35 දක්වා වෙනස් අගයක් ගෙන තිබුණි.

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සපයා ඇති තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට විවිධ තනතුරුවල පුරප්පාඩු 11 ක් ද අතිරික්ත 114 ක් ද පැවතුණි.

බී.පී. අමෙල ඉඳුනිල්,
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත: 1. අධ්‍යක්ෂ ජනරාල් , රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා.

2. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කාරුණික දැනගැනීම සඳහා.